Ethics Eye අපි මින් පෙර බොහෝ විටක පෙන්වා දී ඇති ආකාරයට, සමාජය තුළ භාවිතා වන "කුඩ්ඩා" වැනි ලේබල් කිරීම් වල ඇති ගැටළුව වන්නේ, එම ලේබල් කිරීම් වලට පාදක වන සමාජ කණ්ඩායම් පිළිබඳව සමාජය තුළම ඇති ගර්හාව සහ කොන් කිරීම තවත් මුල්බැස ගැනීමයි. එයින්, එම සමාජ කණ්ඩායම් වලට පුනරුත්ථාපනයෙන් පසුව හෝ යළිත් සමාජය හා එක් වීමට ඇති ඉඩකඩ තවත් ඇහිරෙනු ඇත.

මව්බිම (ඔක්. 17, 2022) සහ ඉරිදා මව්බිම (ඔක්. 16, 2022) පුවත්පත් තුළ වූ පහත දැක්වෙන සිරස්තලයන්හිම "කුඩ්ඩා" යන යෙදුම සඳහන් වී තිබෙනු අපට දක්නට ලැබිණි.

1) "කුඩ්ඩා" යන යෙදුම වෙනුවට, "මත්ද්‍රව්‍ය භාවිතා කරන්නා" වැනි යෙදුමක් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

2) නැතිනම් "කුඩ්ඩා" යන යෙදුමට වඩා සුදුසු වෙනත් යෙදුම් ඔබට යෝජනා කළ හැකි ද?

ධනාත්මක සමාජයක් වෙනුවෙන් සෘණාත්මක ලේබල්කරණයන්ගෙන් වළකිමු!